**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **කෘෂි හා ආහාර තාක්ෂණය - I** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද ජලාශය වනුයේ,
(1) වික්ටෝරියා ජලාශයයි. (2) උඩවලව ජලාශයයි.
(3) සේනානායක සමුද්‍රයයි. (4) උල්හිටිය ජලාශයයි.

02. යැපුම් කෘෂිකර්මය වාණිජ කෘෂිකර්මය බවට පත්වීම නිසා මෙරට ප්‍රධාන බෝග වගාවන් බවට පත් වූයේ,
(1) වී, ගම්මිරිස්, තේ ය. (2) තේ, පොල්, රබර්, කෝපි ය.
(3) කුරුඳු, පොල්, පුවක් ය. (4) කොකෝවා, ගම්මිරිස්, සාදික්කා ය.

03. රටේ ආර්ථික සංවර්ධනයට කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කරුණක් නොවන්නේ,
(1) විදේශ රැකියා සඳහා යොමුකරවීම ය. (2) භූමි පරිභෝජනය වැඩිකිරීම ය.
(3) ආහාර සුරක්ෂිත තාවයට යොමුකරවීම ය. (4) දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම ය.

04. තලවාකැලේ නගරයෙහි ඇති කෘෂිකාර්මික වැදගත්කම කුමක් ද?
(1) බීජ අර්තාපල් පර්යේෂණාගාරය පිහිටීම ය. (2) රබර් පර්යේෂණාගාරය පිහිටීම ය.
(3) තේ පර්යේෂණාගාරය පිහිටීම ය. (4) වී පර්යේෂණාගාරය පිහිටීම ය.

05. වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය හා ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව බෙදාඇති ප්‍රධාන දේශගුණික කලාප වනුයේ,
(1) උඩරට තෙත්, පහතරට තෙත්, පහතරට වියලිකලාපය ය.
(2) තෙත් කලාපය, වියලි කලාපය, අතරමැදි කලාපය ය.
(3) තෙත් කලාපය, වියලි කලාපය, ශුෂ්ක කලාපය ය.
(4) වියලි කලාපය, අර්ධ ශුෂ්ක කලාපය, තෙත් කලාපය ය.

06. පවනේ වියලන ලද පස් සාම්පලයක් 0.2 mm සිදුරු සහිත පෙරණයකින් පෙරණ ලදී. පෙරනයේ මතුපිට ඉතිරි වන්නේ,
(1) රළු වැලි, සියුම් වැලි ය. (2) බොරළු, සියුම් වැලි ය.
(3) බොරළු, රළු වැලි ය. (4) රොන්මඩ, සියුම් වැලි ය.

07. ශාකවල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සඳහා සූර්යාලෝකයට අමතරව අවශ්‍ය වන්නේ,
(1) ජලය, කාබන්ඩයොක්සයිඩ් හා හරිතප්‍රද ය. (2) ඔක්සිජන්, නයිට්‍රජන් හා හරිතප්‍රද ය.
(3) ඔක්සිජන්, ජලවාෂ්ප හා හරිතප්‍රද ය. (4) ජලය, නයිට්‍රජන් හා හරිතප්‍රද ය.

08. සෙවන ප්‍රිය කරන ශාකයක් වන්නේ,
(1) බඩඉරිඟු ය. (2) මිරිස් ය.
(3) උක් ය. (4) ඇන්තූරියම් ය.

09. ශ්‍රී ලංකාවේ වගා කන්න, එම කන්නවලට වර්ෂාව ලබා දෙන මෝසම් සුළඟ සහ වර්ෂාව සහ වර්ෂාව ලැබෙන මාස නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | වගා කන්නය | මෝසම් සුළඟ | වර්ෂාව ලැබෙන මාස |
|---|---|---|---|
| (1) | යල | නිරිත දිග | නොවැම්බර් සිට අප්‍රේල් දක්වා |
| (2) | යල | ඊසාන දිග | මැයි සිට සැප්තැම්බර් දක්වා |
| (3) | මහ | නිරිත දිග | මාර්තු සිට අගෝස්තු දක්වා |
| (4) | මහ | ඊසාන දිග | දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා |

10. පස් සාම්පලයක් ගෙන වීදුරුවකට දමා ජලය සමඟ කලතා තැන්පත් වීමට ඉඩහැරිය විට වැඩිම වේලාවක් ජලය සමග අවලම්භයක් සේ පවතින්නේ,

(1) මැටි ය.
(2) සියුම් වැලි ය.
(3) රොන් මඩ ය.
(4) රළු වැලි ය.

11. මල්පැලයක් සහිත බඳුනකට ජලය සපයන විට ටික වේලාවකින් බඳුන උතුරා ගිය අතර පසුව පහළ පිහිටි ජල වහන සිදුරෙන් ද ජලය පිටවන බව නිරීක්ෂණය විය. මේ වන විට බඳුන තුල ඇති පසේ තිබිය හැකි ජල ආකාර වන්නේ,

(1) කේෂාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලය පමණි.
(2) ජලාකර්ෂණ ජලය පමණයි.
(3) කේෂාකර්ෂණ ජලය, ගුරුත්වාකර්ෂන ජලය හා ජලාකර්ෂණ ජලයයි.
(4) ගුරුත්වාකර්ෂණ ජලය පමණයි.

12. සරල වර්ෂා මානයකින් වර්ෂාව මනින ලද පාසල් සිසුන් පිරිසක් වර්ෂ අවසානයේ පාඨාංක වල එකතුව ලෙස 2610 mm ක් ගනනය කරන ලදී. මෙම පාසල අයත්වන දේශගුණික කලාපය වන්නේ,

(1) තෙත් කලාපයට ය.
(2) වියලි කලාපයට ය.
(3) අතරමැදි කලාපයට ය.
(4) ශුෂ්ක කලාපයට ය.

13. පාංශු ඛාදනය වැඩි වශයෙන් සිදුවීමට ඉඩ ඇත්තේ පහත දැක්වෙන කුමන දේශගුණික හා භූමි ලක්ෂණ ඇති ඉඩම්වල ද?

(1) අඩු වර්ෂාව හා මඳ බෑවුම් සහිත ඉඩම්වල ය.
(2) අධික වර්ෂාව හා මඳ බෑවුම් සහිත ඉඩම්වල ය.
(3) අධික වර්ෂාව හා අධික බෑවුම් සහිත ඉඩම්වල ය.
(4) අඩු වර්ෂාව හා අධික බෑවුම් සහිත ඉඩම්වල ය.

14. පාංශු කැටායන හුවමාරු ධාරිතාවය ඉහළ නැංවීමට දායක වන පාංශු සංඝටක වන්නේ,

(1) රොන් මඩ හා මැටි ය.
(2) මැටි හා හියුමස් ය.
(3) රොන් මඩ හා සියුම් වැලි ය.
(4) රොන් මඩ හා හියුමස් ය.

15. ඇතැම් බෝග තනි වගා වලවල් තුළ සිටුවීම නිර්දේශ කරනු ලබන අතර වලෙහි විශාලත්වය බෝගයේ වර්ගය අනුව වෙනස් වේ. කෙසෙල් සිටුවීම සඳහා නිර්දේශිත වගා වලක විශාල්තවය සෙන්ටිමීටර,

(1) 90 x 90 x 90 ය.
(2) 60 x 60 x 60 ය.
(3) 30 x 30 x 30 ය.
(4) 15 x 15 x 15 ය.

16. එළවළු බීජ තවාන් කිරීම සඳහා සකසන ලද එකිනෙකට ආසන්නව පිහිටි සම්මත පාත්ති දෙකක හරස්කඩ පෙනුම පහත රූපයේ දක්වේ.




ඉහත A හා B නිර්දේශිත මිණුම් අනුපිළිවෙලින් සෙන්ටිමීටර

(1) 50 cm හා 25 cm කි.
(2) 80 cm හා 40 cm කි.
(3) 100 cm හා 30 cm කි.
(4) 125 cm හා 50 cm කි.

17. විද්‍යාත්මක බෝග වර්ගීකරණය ඉදිරිපත් කරන ලද ස්වීඩන් ජාතික විද්‍යාඥයා වන්නේ,

(1) හිපොක්‍රටීස් ය. (2) පයිතගරස් ය.

(3) ආකිමඩීස් ය. (4) කැරෝලස්ලීනියස් ය.

18. ශාක වර්ධක විලාශය අනුව නිවැරදි බෝග වර්ගීකරණය තෝරන්න.

(1) පළල් පත්‍ර, පඳුරු, ගස් (2) පැලෑටි, පඳුරු, ගස්

(3) සිහින් දිගටි පත්‍ර, පළල් පත්‍ර, පඳුරු (4) වැල්, පඳුරු, ගස්

19. වී බෝගයේ උද්භිද විද්‍යාත්මක නාමය නිවැරදිව සඳහන් වන්නේ,

(1) Oryza sativa L ලෙස ය. (2) oryaza sativa ලෙස ය.

(3) Oryza Sativa L ලෙස ය. (4) Oryza sativa ලෙස ය.

20. බෝගවල ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ගතවන කාලය බෝග වර්ගීකරණයේදී යොදාගන්නා එක් නිර්ණායකයකි. ඒ අනුව වාර්ෂික බෝග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සෝයා බෝංචි, වී, මිරිස්, ගම්මිරිස් ය. (2) බුලත්, වම්බටු, කැකිරි, කරවිල ය.

(3) ගෝවා, තක්කාලි, මෑ, කුරුඳු ය. (4) බඩ ඉරිඟු, මුං, බණ්ඩක්කා, වී ය.

21. තවාන් මිශ්‍රණය සඳහා යොදාගනු ලබන මතුපිට පස් හා කොම්පෝස්ට් අනුපාතය වනුයේ,

(1) 1 : 1 ය. (2) 2 : 1 ය. (3) 1 : 2 ය. (4) 3 : 1 ය.

22. උඩරට තෙත් කලාපයේ තේ වගා කිරීමට නොහැකි බිම්වල වගාකළ හැකි පුනරුත්ථාපන බෝගයක් වන්නේ,

(1) ගෝතමාලා ය. (2) මුරුංගා ය.

(3) වට්ටක්කා ය. (4) කැලපගෝනියම් ය.

23. ශීත දේශගුණයක් සහිත උඩරට ප්‍රදේශයේ මෙන් නොව උෂ්ණ දේශගුනයක් සහිත යාපනයේ ද අර්ථාපල් වගාකර සාර්ථක අස්වැන්නක් ලබාගත හැකි ය. එම සාර්ථකත්වයට හේතු වන්නේ,

(1) දහවල් ශීත දේශගුණය හා උණුසුම් රාත්‍රී කාලය.

(2) අධික වර්ෂාපතනය හා අධික ආර්ද්‍රතාවය.

(3) තද සුළං සහිත රාත්‍රිය හා රාත්‍රී අඩු උෂ්ණත්වය.

(4) උණුසුම් දහවල් කාලය හා ශීත රාත්‍රී කාලය.

24. බෑවුම් වූ ස්ථාන හරහා ජලය ගලා යාම නිසා ඛාදනයට ගොදුරු වී කුඩා ඇලි ඇතිකරන අතර බිම් සැකසීම මගින් එය නැවත යථා තත්ත්වයට පත් කල හැකි ඛාදන අවස්ථාව වනුයේ,

(1) විසිරි ඛාදනය යි. (2) ඇලි ඛාදනය යි.

(3) ස්ථරිය ඛාදනය යි. (4) රළ ඛාදනය යි.

25. තවාන් බඳුනක පතුලට ගඩොල් කැබලි තට්ටුවක් දැමීමෙන් බලාපොරොත්තු වන්නේ,

(1) ජලවහනය දියුණු කිරීමයි.

(2) මූල කේෂ වර්ධනය හා පැල ස්ථාවර වීමයි.

(3) දිලීර රෝග වැලැක්වීම හා ජලයේ ඇති ලවණ අවශෝෂණය වීමයි.

(4) මුල් පැතිරී වර්ධනය වීම හා ජලයේ ඇති ලවණ තැන්පත් වීමයි.

26. රනිල බීජ කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවයි. මෙයට හේතුව ලෙස සැලකිය හැක්කේ,

(1) සියලුම රනිල බීජ ඉතා හොඳින් පැළවීමයි.

(2) රනිල බීජ තවාන් කළ විට ලැබෙන අස්වැන්න අඩු වීමයි.

(3) රනිල බීජ පැළ තවානේ දී පළිබෝධ හානිවලට පාත්‍ර වීමයි.

(4) රනිල බීජ උදුරා සිටුවීමට ඔරොත්තු නොදීමයි.

27. හොඳින් ජලය බැස නොයන භූමියක වගා කිරීමට ඔබ තෝරාගන්නා බෝගයක් වන්නේ,

(1) කොහිල ය. (2) මුං ඇට ය. (3) තක්කාලි ය. (4) මිරිස් ය.

28. වගාවක් සඳහා බිංදු ජල සම්පාදනය භාවිතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) බිංදු ජල සම්පාදනය සඳහා විශාල ජල ප්‍රභවයක් අවශය වේ.

(2) බිංදු ජල සම්පාදනය සඳහා වැඩි ප්‍රාග්ධනයක් අවශය නොවේ.

(3) ජලය කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගත හැක්කේ බිංදු ජල සම්පාදනයෙනි.

(4) බිංදු ජල සම්පාදනය සඳහා අඩු තාක්ෂණික දැනුමක් වුවද ප්‍රමාණවත් වේ.

29. කලාඔය හරස්කොට කලා වැව නිර්මාණය කල අතර මල්වතුඔය හරස් කොට නිර්මාණය කර ඇත්තේ කුමන වැව ද?

(1) බසවක්කුලම වැව ය. (2) නාච්චදූව වැව ය.

(3) හුරුළු වැව ය. (4) මින්නේරිය වැව ය.

30. ගංගා දෙපස බහුලව දැකිය හැකි පස් බාණ්ඩය වන්නේ,

(1) රතු දුඹුරු පස් ය. (2) රතු කහ පොඩ්සොලික් පස ය.

(3) දියළු පස ය. (4) මැටි ලෝම පස ය.

31. විසිරි ජල සම්පාදනයේ වාසියක් වන්නේ,

(1) ස්ථාපනය කිරීම සඳහා වැයවන මූලික වියදම අඩුයි.

(2) සමතලා නොවන ඉඩම්වලට යොදාගත හැකි වීම යි.

(3) උසට වැවෙන බෝග සඳහා ද යොදාගත හැකි වීම යි.

(4) අධික සුළං සහිත ප්‍රදේශවලටද යොදාගත හැකි වීම යි.

32. ඉල්මැස්සාගේ හානියට බහුලව පාත්‍රවන ශාක කුලය වන්නේ,

(1) සොලනේසියේ කුලය (2) කුකුබිටේසියේ කුලය

(3) ෆැබේසියේ කුලය (4) පොඒසියේ කුලය

33. ගල්, මුල් සහිත බිමක් සැකසීමට වඩාත් සුදුසු නගුල් වර්ගය වන්නේ,

(1) තැටි නගුල ය. (2) තැටි පෝරුව ය. (3) රොටවේටරය ය. (4) කොකු නගුල ය.

34. බීජවල වැඩි ප්‍රෝටීන් ප්‍රමාණයක් අන්තර්ගත වීම හා වායු ගෝලයෙන් නයිට්‍රජන් ලබාගැනීම යන ලක්ෂණ ඇති ශාක කුලය වන්නේ,

(1) සොලෙන්සියේ කුලය වේ. (2) රුටේසියේ කුලය වේ.

(3) මැල්වේසියේ කුලය වේ. (4) ෆැබේසියේ කුලය වේ.

35. පැළ දැඩි කිරීමේ ක්‍රියාවලියේදී <u>නොකළ යුතු</u> කාර්යයක් වන්නේ,

(1) ජලය යොදන වාර ගණන අඩු කිරීම ය.

(2) ආලෝකයට නිරාවරණය වීම වැඩි කිරීම ය.

(3) ජලය යොදන කාලාන්තර වැඩි කිරීම ය.

(4) N අඩංගු පොහොර වැඩියෙන් යෙදීම ය.

36. තවාන් සඳහා සෙවන සැපයීමේදී තවානට කොපමණ උසකින් සෙවන සැපයීම කළ යුතු ද?

(1) 60 cm පමණ ය. (2) 30 cm පමණ ය. (3) 15 cm පමණ ය. (4) 45 cm පමණ ය.

37. කෙටි දින ශාක කාණ්ඩයට අයත් වන බෝග කාණ්ඩය අයත් වරණය වන්නේ,

(1) උක්, බීට්, කැරට්, රාබු ය. (2) උක්, කෝපි, මුං, දුම්කොළ ය.

(3) මිරිස්, කව්පි, බෝංචි, තක්කාලි ය. (4) ස්ට්‍රෝබෙරි, එළු, අර්තාපල්, උක් ය.

38. පසෙහි භෞතික රසායනික සහ ජෛව ගුණාංග පිරිහීම නිසා බෝග වගාවට අහිතකර වීමෙන් පසේ නිෂ්පාදන ශක්තිය පිරිහීයාම හඳුන් වන්නේ,

(1) පාංශු ආම්ලිකතාවය ලෙස යි. (2) පාංශු ක්ෂාරීයතාවය ලෙස යි.

(3) පාංශු හායනය ලෙස යි. (4) මේ කිසිවක් නොවේ.

39. බේසම් ජල සම්පාදන ක්‍රමය වඩාත් සුදුසු වන්නේ පහත කුමන බෝග කාණ්ඩයට ද?

(1) කෙසෙල්, වී, පොල්, රබර් ය. (2) වී. පොල්, මිදි, ගොටුකොළ ය.

(3) කංකුං, ගොටුකොළ, කොහිල, බණ්ඩක්කාය. (4) අඹ, කෙසෙල්, අලිගැට පේර, මිදිය.

40. WU සංකේතයෙන් හඳුන්වනු ලබන කෘෂි දේශගුණික කලාපය වන්නේ,

(1) පහතරට තෙත් කලාපය ය. (2) මැදරට තෙත් කලාපය ය.

(3) උඩරට තෙත් කලාපය ය. (4) උඩරට අතරමැදි කලාපය ය.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

# කෘෂි හා ආහාර තාක්ෂණය - II

| නම/ විභාග අංකයෘ |
|---|

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

(01) කන්න රැස්වීමේදී ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයා පැවසුයේ බිම් සකස් කිරීම සඳහා උපකරණ භාවිතය රෝපණ ද්‍රව්‍ය භාවිතය හා පශ්චාත් කටයුතු ප්‍රසස්ථව භාවිතා කිරීම තුළින් ඉහළ අස්වැන්නක් ලබාගත හැකි බවකි.

i. වගා බිමක මූලික බිම් සකස් කිරීමේ ප්‍රධාන පියවර දෙක නම් කරන්න.



ii. A - රූපයේ ඇති උපකරණය කුමක් ද?

B - එම උපකරණය සම්බන්ධ කරන යන්ත්‍රය කුමක් ද?

iii. අතුරුයත්ගෑම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

iv. බිම් සකස් කිරීම තුළින් පසේ දියුණුවන භෞතික තත්වයන් දෙකක් ලියන්න.

v. a. රෝපන ද්‍රව්‍ය ලබාගැනීමට භාවිතා කරන තවාන් පාත්ති වර්ග දෙකක් නම් කරන්න.

b. ඉහත තවාන් පාත්ති වලින් තෙත් කලාපය සඳහා වඩාත් උචිත තවාන් පාත්ති වර්ගය නම් කරන්න.

vi. a. තවාන් පාත්ති ජීවාණුහරණය කිරීම සඳහා භාවිතා කළ හැකි පරිසර හිතකාමී ක්‍රමයක් නම් කරන්න.

b. තවාන් පාත්ති ජීවාණුහරණය කිරීමේ අරමුණක් දක්වන්න.

vii. බෝගයක් සංස්ථාපනය කිරීමේදී නිවැරදි ගැඹුර හා පරතර තබා <u>නොගැනීමේ</u> අවාසි දෙකක් ලියන්න.

viii. පසෙන් ජලය ඉවත්වන ක්‍රම දෙකක් ලියන්න.

ix. බෝගයකට වසුන් යෙදීමේදී වාසි දෙකක් ලියන්න.

x. පාංශු ජලය සංරක්ෂණය කරගැනීමට අනුගමනය කල හැකි ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

02. අතීතයේ රජ දවස ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිතව පැවතීමට ප්‍රධාන හේතුව වාරි තාක්ෂණය බව පෙන්වා දී ඇත.

i. a. රජරට වැව් පද්ධතියේ එක වැවක් පෝෂනය වන ප්‍රදේශය ඊළඟ වැවේ ජල පෝෂක ප්‍රදේශය ලෙස පවත්වාගෙන යන ආකාරයට විද්‍යාත්මකව නිර්මාණය කර ඇත. මෙය කුමන නමකින් හැඳින්වේ ද?

b. අනුරාධපුර යුගයේ ඉදිවූ ප්‍රථම වැව කුමන නමකින් හැඳින්වේ ද?

c. කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයන ජයගඟ හෙවත් යෝධ ඇල කුමන රජතුමාගේ නිර්මාණයක් ද?

ii. වැවක ප්‍රධාන අංග දෙකක් නම් කර ඒවයේ වැදගත්කම කෙටියෙන් දක්වන්න.

iii. අතීතයේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පැවති බවට සාක්ෂි 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්‍රදේශයට ගැලපෙන ලෙස බෝග තෝරා ගැනීමටත් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හා බෝග හානි අවම කරගැනීමටත් දේශගුණය හා කාලගුණික පරාමිතීන් පිළිබඳව දැන සිටීම වැදගත් ය.

පහත A, B, C රූපසටහන්වලින් පෙන්වා ඇත්තේ කාලගුණික පරාමිතීන් මනින උපකරණ 3 කි.



A




B



C

i. a. ඉහත A, B, C උපකරණ නම් කරන්න.

b. ඉහත A උපකරණය ස්ථාපනය කිරීමට ස්ථානයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු දෙකක් ලියන්න.

ii. a. පරිසර උෂ්ණත්වය ඉහළ යාම සඳහා හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

b. ප්‍රභා අවධි සංවේදීතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. බෝග වගා කෙරෙහි සාපේක්ෂ ආර්ද්‍රතාවය අහිතකර ලෙස බලපාන අවස්ථා දෙකක් ලියන්න.

04. බෝග වගාව සඳහා බොහෝ විට උපස්ථරය වන්නේ පසයි. සරු පසක උරුමය මෙන්ම පසේ ඇති වැදගත්කම ඊට හේතුවයි.

i. පස සෑදීමට හේතුවන පාෂාණ වර්ග මොනවා ද?

ii. a. පසේ රසායනික ජීරණයට බලපාන හේතු දෙකක් ලියන්න.

b. බෝග වගාවට පසේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

iii. පසේ ක්ෂාරීයතාවය මගහරවා ගැනීමට සිදුකළ හැකි කාර්යයන් 3ක් ලියන්න.

05. රෝපණ ද්‍රව්‍ය වගා බිමෙහි ස්ථාපිත කිරීම බෝග සංස්ථාපනය ලෙස හඳුන්වයි.

i. a. බෝග සංස්ථාපන ප්‍රධාන ක්‍රම මොනවා ද?

b. දෙපේලි ක්‍රමයට හිටුවන බෝගයක් නම් කරන්න.

ii. අහඹු ලෙස වපුරන බෝග දෙකක් ලියන්න.

iii. a. බෝග සංස්ථාපනය කිරීම සඳහා උපකරණ භාවිතා කිරීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න.

b. යන්ත්‍ර බලයෙන් ක්‍රියාත්මක කරන බිම් සැකසුම් උපකරණ භාවිතයේ වාසි 3ක් සඳහන් කරන්න.

06. තිරසර සංවර්ධන පාසල් වැඩසටහන යටතේ පාසල් තුල පැල තවාන් ඇතිකර වඩාත් යහපත් පරිසරයක් නිර්මාණය කිරීමට පියවර ගෙන ඇත.

i. එළවළු බෝගවලට අමතරව පාසල් ගෙවත්තෙහි වගාකළ හැකි වෙනත් ආහාර බෝග කාණ්ඩ හතරක් සඳහන් කරන්න.

ii. පැළ තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේදී සලකා බැලිය යුතු සාදක දෙකක් ලියන්න.

iii. a. මූල මණ්ඩලයට හානියක් නොවන පරිදි ක්ෂෙත්‍රයේ සිටුවීමට තවාන් පැළ ලබාගැනීම සඳහා සකස් කළ හැකි තවාන් පාත්ති දෙකක් ලියන්න.

b. බඳුන් තවාන් ලෙස භාවිතා කළ හැකි බඳුන් වර්ග හතරක් ලියන්න.

c. තවාන් මිශ්‍රණයක තෙතමන තත්ත්වය පරීක්ෂා කරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

07. වියලි කලාපයේ ජීවත්වන ගොවි මහතෙක් ජල සම්පාදන ක්‍රම ජල සංරක්ෂණ ක්‍රම යොදා ගනිමින් බෝග වගාවක් ආරම්භ කරන ලදී.

i. බෝග වගාව සඳහා ජලයේ ඇති වැදගත්කම් හතරක් ලියන්න.

ii. a. යහපත් ජල වහනයේ වාසි දෙකක් ලියන්න.

b. බෝගවලට ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී ඔහු සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

iii. a. පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් ලියන්න.

b. වැසි ජලය සංරක්ෂණය කිරීමේ වාසි දෙකක් ලියන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව — දෙවන වාර පරීක්ෂණය **2018**

**10 ශ්‍රේණිය — කෘෂි හා ආහාර තාක්ෂණය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(1) | 4 -(3) | 5 -(2) | 6 -(3) | 7 -(1) | 8 -(4) | 9 -(4) | 10 -(1) |
| 11-(3) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(2) | 16 -(3) | 17 -(4) | 18 -(2) | 19 -(1) | 20 -(4) |
| 21-(1) | 22 -(1) | 23 -(4) | 24 -(1) | 25 -(1) | 26 -(4) | 27 -(1) | 28 -(3) | 29 -(2) | 30 -(3) |
| 31-(2) | 32 -(2) | 33 -(1) | 34 -(4) | 35 -(4) | 36 -(1) | 37 -(2) | 38 -(3) | 39 -(4) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. ප්‍රාථමික, ද්විතියික (ල. 02)

ii. a. ජපන් පරිවර්ත්‍ය නගුල (මොල් බෝඩ්) (ල. 01)

b. රෝද දෙකේ ට්‍රැක්ටරය (ල. 01)

iii. බෝගයක් ක්ෂේත්‍රයේ හිටුවීමෙන් පසු පසට කරනා විවිධ ක්‍රියාවන්. (ල. 02)

iv. පාංශු ව්‍යුහය, වයනය, වාතය ආදී ලක්ෂණ (ල. 02)

v. a. උස් පාත්ති, ගිල්වූ පාත්ති (ල. 01)

b. උස් පාත්ති (ල. 01)

vi. a. මතුපිට පිලිස්සීම මගින් පස තැම්බීම (ල. 01)

b. රෝග කාරක ජීවීන් විනාශ කිරීම. (ල. 01)

vii. මුල් වර්ධනය බාධා වීම./ අතු පැතිරීම බාධා වීම ආදී (ල. 02)

viii. වාෂ්පීකරණය, උත්ස්වේදනය ආදී (ල. 02)

ix. ජලය වාෂ්පීකරණය අඩුවීම, වල් පැල මර්ධනය ආදී (ල. 02)

x. කාබනික ද්‍රව්‍ය යෙදීම, වල් පැල මර්ධනය, මසුන් යෙදීම ආදී (ල. 02)

02. i. a. එල්ලන්ගා පද්ධතිය (ල. 01)

b. අභය වැව (ල. 01)

c. ධාතුසේන රජතුමා (ල. 01)

ii. අංග නම් කිරීම (ල. 02)

විස්තර කිරීමට (ල. 02)

iii. පෙරදිග ධාන්‍යාගාරය, පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රකාශය ආදී (ල. 03)

03. i. a. සරල වර්ෂාමානය, උපරිම හා අවම උෂ්නත්ව මානය, සූර්ය දීප්ති මානය (ල. 03)

b. අවට බාධා නොමැති වීම, ආධාරකයේ වර්ගඵලය පතුලේ වර්ගඵලයට සමාන වීම, පුනීලයේ, යට පොළව මට්ටමේ සිට 30cm ඉහළින් සවි කිරීම. ආදී කරුණු (ල. 02)

ii. a. පොසිල ඉන්ධන දහනය, වන විනාශය ආදී (ල. 02)

b. පුෂ්ප හටගැනීමේදී දිවා කාලයේ දිග කෙරෙහි ශාක දක්වන ප්‍රතිචාර (ල. 01)

iii. ශාක රෝග ආසාදන වැඩි වීම., පළිබෝධ ව්‍යාප්තිය වැඩි වීම., පරාග විසිරීමට බාධා වීම (ල. 02)

04. i. ආග්නේය, විපරිත, අවසාධිත (ල. 03)

ii. a. ඔක්සිජන්, කාබන්ඩයොක්සයිඩ්, ජලය ($O_2$ , $CO_2$ , $H_2O$) (ල. 02)

b. මූල පද්ධතිය දරා සිටීමට උපස්තරය ලෙස, ශාක පෝෂක ලබාගැනීම, පාංශු ජීවීන්ට වාසස්ථාන (ප. 02)

iii. කාබනික ද්‍රව්‍ය පසට එක් කිරීම, S යෙදීම, ජිප්සම් යෙදීම (ල. 03)

05. i. a. සෘජුවම ක්ෂේත්‍රයේ සිටුවීම, තවාන් කර ලබාගත් පැල සිටුවීම (ල. 02)

b. අන්නාසි (ල. 01)

ii. වී, තල, කුරක්කන්, ආදී (ල. 02)

iii. a. කාලය අඩු වීම, වල් නෙලීම පහසුය, ශ්‍රමය අඩු වීම ආදී (ල. 02)

b. කාර්යක්ෂමතාවය වැඩිය.

අඩු කාලයකින් වැඩි වැඩ ප්‍රමාණයක් කිරීම, විශාල ඉඩම්වල යොදාගත හැකි ය. ආදී (ල. 03)

06. i. ධාන්‍ය බෝග, අල බෝග, මාංශ බෝග, පළතුරු බෝග (ල. 02)

ii. හොඳින් හිරු එළිය ඇති ස්ථානයක්, ජල වහන, ජල පහසුකම් ඇති ස්ථානයක්, සමතලා බිමක් වීම ආදී (ල. 02)

iii. a. නොරිඩෝකෝ (කුට්ටි තවාන්) / තැටි තවාන් (ල. 02)

b. පොල් ලෙලි, පොල් කටු, කිරි හට්ටි, කෙසෙල් පට්ටා බඳුන්, ප්ලාස්ටික් කෝප්ප, පොලිතීන් බඳුන් ආදී (ප. 02)

c. තවාන් මිශ්‍රයෙන් ස්වල්පයක් අතට ගෙන තදකර (ල. 02)

07. i. කායික ක්‍රියා, බීජ ප්‍රරෝහනය, පෝෂක අවශෝෂණය, බිම් සැකසීමේ පහසුව ආදී (ල. 02)

ii. a. පසේ වාතය යහපත් වේ.

මූල පද්ධතිය හොඳින් වර්ධනය වේ.

පසේ උෂ්ණත්වය ආරක්‍ෂා වීම ආදී (ල. 02)

b. වගාකර ඇති බෝගය, බෝගයේ වර්ධන අවස්ථාව, පසේ වයනය ආදී (ල. 02)

iii. a. පිටාර, තීරු, බේසම්, ඇලි සහ වැටි (ල. 02)

b. අඩු වියදමකින් ගුණාත්මයෙන් ඉහළ ජලය ලබාගත හැක.

ගෘහස්ත කටයුතු සඳහා භාවිතා කළ හැකි වීම.

ගොවිතැන් කටයුතු සඳහා භාවිතා කළ හැකි වීම. (ල. 02)